

ඉදිරි මහ මැතිවරණයෙන් පසු සුබවාදී පාලනයක් උදෙසා රජය පොළඹවන හා දිරිගන්වන කරුණු දොළහකින් යුත් න්‍යාය පත්‍රයක් ශ්‍රී ලංකා ජාතික කොංග්‍රසය මහජනතාවට ඉදිරිපත් කරයි. ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්නටත්, සිවිල් සමාජය ශක්තිමත් කරන්නටත් හේතුවන මෙම ප්‍රමුඛ කරුණු වෙනුවෙන් මහජනතාව සමග සම්මුතියකට එළැඹෙන බව එහි නායක අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා කියා සිටී.

එහි පළමු පිටපත් අමාත්‍යවරයා විසින් සියම් නිකායේ මල්වතු පාර්ශ්වයේ මහා නායක අති පූජ්‍ය තිබ්බොටුවාවේ ශ්‍රී සුමංගලාභිධාන හිමිපාණන් සහ අස්ගිරි පාර්ශ්වයේ මහා නායක අති පූජ්‍ය උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත හිමිපාණන් වෙත ඊයේ (පෙබ. 12) පෙරවරුවේ පිරිනමන ලදී. ඡායාරූපයේ දැක්වෙනුයේ එම අවස්ථාවයි.

මෙහි දී නව වැඩපිළිවෙළ සහිත ස්වකීය දර්ශනය මහ නාහිමිවරුන්ට පැහැදිලි කළ අතර මහා සංඝරත්නය යහපත් කාර්යයන් උදෙසා ආශිර්වාද කරන බව නාහිමිපාණන් වහන්සේලා මෙහි දී ප්‍රකාශ කළහ.